සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/04/ER/03/කඩිනම් සමෘද්ධි ගෙවතු
ඔබේ අංකය / உமது இல / Your No: ..........
දිනය / திகதி / Date: 2020.04.08

සියළුම සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,

**"සෞභාග්‍යා ගෙවත්ත"**

**සමෘද්ධි ආදර්ශ ගෙවතු වගා වැඩසටහන - 2020**

උක්ත කරුණ සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2020.03.25 දිනැති චක්‍ර ලේඛනයට වැඩිමනක් වශයෙනි.

02. සමෘද්ධි ආදර්ශ ගෙවතු වගා වැඩසටහන යටතේ සෑම ග්‍රාම නිලධාරී වසමකම ගෙවතු 20 ක් ක්‍රියාත්මක කළ යුතු අතර මේ සඳහා මේ වනවිටත් ඔබ විසින් හඳුනාගත් සමෘද්ධි ප්‍රතිලාභීන් / අඩු ආදායම්ලාභීන් වෙත බීජ හා රෝපණ ද්‍රව්‍ය කඩිනමින් සපයා දිය යුතුව ඇත.

03. මේ දිනවල පවතින කොරෝනා Covid – 19 රෝගය හේතුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පවතින සේවක හිඟතාවය සහ පොළිතීන් ලබාගැනීමේ දුෂ්කරතාවය මත බීජ පැකට් කර ලබාදිය නොහැකි බව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත. එහෙත් කඩිනමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බවට රජයෙන් උපදෙස් ලබාදී ඇති බැවින් මේ සමඟ එවා ඇති ඇමුණුමේ දක්වා ඇති ආකාරයට ඔබ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාවට අනුව වෙන් කළ බීජ සංඛ්‍යාව සහ බීජ බහාලන කවර ඔබ වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව ඔබ දිස්ත්‍රික්කයට අදාල බීජ ප්‍රමාණයන් නිල්ලඹ සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා කර ඇති අතර එම පුහුණු මධ්‍යස්ථානයේ ස්ථානභාර නිලධාරී යූ.එම්. අමරසිංහ මහතාගෙන් විමසා (071-8151218) අදාල බීජ ඉහත මධ්‍යස්ථානයෙන් 2020.04.10 දින නිකුත් කිරීමට කටයුතු යොදා ඇති අතර එම බීජ ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුවේ. මේ සඳහා ඔබ දිස්ත්‍රික්කයේ ජීවනෝපාය විෂයභාර කළමණාකරු යොදවා ගැනීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887** |

04. ඔබ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි අදාළ නිලධාරීන් යොදවා ගෙන සාම්පල පැකට්ටුවේ සඳහන් ප්‍රමාණයන්ට අනුකූල වන ලෙස බීජ ඇසුරුම් කර ගැනීමට සුදුසු ක්‍රමවේදයක් යොදා ගන්නා ලෙස දන්වමි. හඳුනා ගත් ගෙවතු හිමියන් ,සියළු සමෘද්ධි නිලධාරීන් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා බීජ කඩිනමින් ලබාදිය යුතු අතර බීජ වල ප්‍රරෝහණ ශක්තිය හීන විය හැකි බැවින් ඉතා ඉක්මනින් බීජ ක්ෂේත්‍රයේ සිටුවීමට සිදු වන බැවින් බීජ ක්ෂේත්‍රයේ සිටුවීම අළුත් අවුරුදු උදාවත් සමඟ ආරම්භ කරන මෙන් ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

05. මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබගේ සමීප පසුවිපරම ඉතා වැදගත් වන බැවින් මේ පිළිබඳ ඔබගේ පෞද්ගලික අවධානය යොමු කරන ලෙසත් ඉදිරියේ ලබාදෙන ආකෘති පත්‍ර අනුව මෙහි මාසික ප්‍රගතිය ලබාදීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:- 1. ලේකම්, කාන්තා, ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
2. ලේකම්, මහවැලි කෘෂිකර්ම වාරි මාර්ග හා ග්‍රාමීය සංවර්ධන අමා. - කා.දැ.ගැ.පි.
3. ලේකම්, සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
4. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
8. සියළුම අංශ ප්‍රධානීන් - කා.දැ.ගැ.පි.

අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

**බීජ වර්ග ලබා ගැනීම**

පහත සඳහන් බීජ වර්ග පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් නිවැරදිව භාර ගනිමි.

1.
2.
3.
4.
5.
6.
7.

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ